වාර්ෂික වාර්තාව

2020

බුද්ධශාසන අරමුදල

අංක 135
ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත
කොළඹ 07

දුරකථන - 0112303293
විද්‍යුත් තැපැල-bsfund@mbs.gov.lk
වෙබ් අඩවිය -www.mbs.gov.lk/web/buddhasasana-fund

2020 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව

බුද්ධශාසන අරමුදල

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - අරමුදලේ පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

පටුන

පිටු අංකය

01 පරිච්ඡේදය - අරමුදලේ පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම - 01

1.2 අරමුදල පිහිටුවා ඇති නෛතික රාමුව (පනත, භාර ඔප්පුව, වෙනත්) - 01

1.3 අරමුදලේ පරමාර්ථ - 01

1.4 අරමුදලේ දැක්ම, මෙහෙවර, අරමුණු - 02

1.5 ප්‍රධාන කාර්යයන් - 02

1.6 සංවිධාන සටහන - 03

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය

2.1.1 සාමණේර ආයතන පවත්වාගෙන යෑම සඳහා මූල්‍යාධාර ලබාදීම හා පරික්ෂාව - 04-05

2.1.2 සාමණේර ආයතන වර්ෂාවසාන පරීක්ෂණ පැවැත්වීම - 05-06

2.1.3 සම්බුද්ධ ජයන්ති සාමණේර ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමය - 06-07

2.1.4 භික්ෂු වෛද්‍යාධාර වැඩසටහන - 07-09

2.1.5 බුදුපුත් සුරක්ෂා සෞඛ්‍ය ආරක්ෂණ වැඩසටහන - 09-10

2.1.6 වයස්ගතව පැවිදි වූ භික්ෂූන් වහන්සේලාට ප්‍රායෝගිකව පුහුණුව ලබා දීම - 10

2.1.7 දුෂ්කර විහාරස්ථාන වලට සනීපාරක්ෂක පහසුකම් සඳහා ආධාර ලබා දීම - 11

2.1.8 භාෂා හා සංස්කෘතික අධ්‍යාපන පාඨමාලා පැවැත්වීමේ වැඩසටහන - 11-12

2.2 ඉදිරි ඉලක්ක - 12-13

03. පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශය - 14-17

3.2 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය - 18

3.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය - 18

3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය - 18-19

3.5 විගණකාධිපතිවරයාගේ වාර්තාව - 20-26

04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 අරමුදලේ කාර්ය සාධන දර්ශක - 27

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු - 28

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග - 28

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය - 29

6.2 කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම - 29

6.3 මානව සම්පත් සංවර්ධනය - 29

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව - 30-39

01 පරිච්ඡේදය

අරමුදලේ පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන වගන්තියට අනුව,"ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේය. එහෙයින් 10 වන ව්‍යවස්ථාවෙහි හා 14 වන ව්‍යවස්ථාවෙහි (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදය මගින් සියළුම ආගම් වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේය" ලෙස දැක්වේ.

එකී කාර්යභාරයට අනුව බුද්ධශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම සඳහා අරමුදල් එකතු කිරීම හා සම්පාදනය කිරීම සඳහා බුද්ධශාසන අරමුදල නමින් මෙම අරමුදල පිහිටුවා ඇත.

2019 දෙසැම්බර් මස 10 දිනැති ගැසට් නිවේදනය අනුව විෂය පථයන් වෙන් කිරීමට අනුව දැනට මෙම අරමුදල බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ විෂය පථය යටතට පැවරී ඇති අතර බුද්ධ ශාසනයේ උන්නතිය උදෙසා මෙමගින් විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වීම සිදු වේ.

2020 වර්ෂයේ මුළු දිවයිනටම බලපෑ කොවිඩ් - (19) වසංගත රෝගී තත්වය හමුවේ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතාවයන් පැවතිය ද එම තත්වය කළමණාකරනය කර ගනිමින් සැලසුම් ගත කාර්යයන් බහුතරයක් ඉටු කර ගැනීමට මෙම වසරේ දී හැකියාව ලැබී ඇත.

1.2 අරමුදල පිහිටා ඇති නෛතික රාමුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල් පනත මගින් බුද්ධශාසන අරමුදල පිහිටුවා ඇති අතර බුද්ධශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම සඳහා අරමුදල් එකතු කිරීම හා සම්පාදනය කිරීම උදෙසා "බුද්ධශාසන අරමුදල" නමින් අරමුදලක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතක් ලෙස මෙම පනත හඳුන්වා ඇත.

1.3 අරමුදලේ පරමාර්ථ

සම්බුදු ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාත්මික හා සාමාජීය සංවර්ධනයට දායක වෙමින්, විහාරස්ථානයන්හි ප්‍රත්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමෙන් බුද්ධශාසනයේ ස්ථිර පැවැත්ම වෙනුවෙන් කටයුතු සිදු කිරීම.

1.4 අරමුදලේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

බොදු පිළිවෙත් රකින, සාරධර්ම සපිරි ගුණගරුක දැහැමි සමාජයක් බිහිකිරීම.

මෙහෙවර

සම්බුදු ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම සඳහා භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාත්මික හා සාමාජීය සංවර්ධනයට දායක වෙමින්, විහාරස්ථානයන්හි ප්‍රත්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමෙන් බුද්ධශාසනයේ ස්ථිර පැවැත්ම වෙනුවෙන් කටයුතු සිදු කිරීම.

අරමුණු

I. බුද්ධශාසනය ආරක්ෂා කිරීම සඳහා සුදුසු වැඩ සටහන් සිදු කිරීම.
II. බුද්ධශාසනය පෝෂණය කිරීම සඳහා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

1.5 ප්‍රධාන කාර්යයන්

1.දේශිය හා විදේශීය ප්‍රභවයන්ගෙන් ලැබෙන සියලු ප්‍රදානයන් හා පරිත්‍යාග භාර ගැනීම.

2. අරමුදල සතු මුදල් වඩාත් ඵලදායි ලෙස ආයෝජනය කිරීම.

3. සාමණේර ආයතන සඳහා මාසික මූල්‍යාධාර පිරිනැමීම සහ සාමණේරයන් වහන්සේලාගේ දහම් දැනුම හා වත් පිළිවෙත් පිළිබඳ වාර්ෂික ඇගයීම.

4. සාමණේර කැපකරු ශිෂ්‍යාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

5.ථේරවාදී ධර්ම ප්‍රචාරය උදෙසා ස්වාමීන්වහන්සේලා සඳහා විවිධ භාෂා පාඨමාලා ක්‍රියාත්මක කිරීම.

6. දුෂ්කර විහාරස්ථාන සඳහා සනීපාරක්ෂක ඇතුළු වෙනත් පහසුකම් ලබාදීම.

7. වයස්ගතව පැවිදි වන භික්ෂූන් වහන්සේලා උදෙසා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

8. භික්ෂූන් වහන්සේලා උදෙසා වෛද්‍යාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

9. බුදුපුත් සුරක්ෂා සෞඛ්‍ය ආරක්ෂණ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම.

10. බුද්ධශාසනය ආරක්ෂා කිරීම සහ පෝෂණය කිරීම වෙනුවෙන් පාලක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අනෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

1.6 සංවිධාන ව්‍යුහය


පාලක මණ්ඩලය
උපදේශක මණ්ඩලය
අරමුදලේ ලේකම්
(01)
ගණකාධිකාරී (01)
ශාඛා ප්‍රධානී 01
(කළමණාකරන සහකාර)
විෂය නිලධාරී
(සංවර්ධන
නිලධාරී 01)
විෂය නිලධාරී
(සංවර්ධන
නිලධාරී 01)
විෂය නිලධාරී
(සංවර්ධන
නිලධාරී 01)
විෂය නිලධාරී
(සංවර්ධන
නිලධාරී 01)
කා.කා.ස 01

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රගතිය

2.1.1 සාමණේර ආයතන පවත්වාගෙන යෑම සඳහා මූල්‍යාධාර ලබාදීම හා පරික්ෂා කිරීමේ වැඩ සටහන

ගිහි ජීවිතය අතහැර පැවිදි ජීවිතයට ඇතුළත් වන දරුවා කෙටි කාලයකින් පිරිවෙන් අධ්‍යාපනය වෙත යොමු කෙරේ. අතීතයේ පැවති ක්‍රමය වූයේ කුල දරුවෙකු වසර දෙක තුනක් විහාරස්ථානයක සිටිමින් පැවිදි ජීවිතය හා බණ දහම් පිළිබඳ අවබෝධය ලබා ගනිමින් සිය කැමැත්තෙන්ම පැවිදි ජීවිතයට ඇතුළු වීමයි. නමුත් වර්තමානයේ පැවිදි ජීවිතයට ප්‍රවේශ වන කුල දරුවන්ට සසුන්ගත වීමට පෙර පැවිදි ජීවිතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඇති අවස්ථා අඩුය. මෙම අවශ්‍යතාවය අවබෝධ කර ගනිමින් බුද්ධශාසන අරමුදල පිහිටුවීමෙන් පසු ආරම්භ කළ ඵලදායී ව්‍යාපෘතියක් ලෙස මෙම සාමණේර අධ්‍යාපන වැඩසටහන හඳුනාගත හැකිවේ. කුඩා සාමණේර හිමිවරුන්ට භික්ෂුත්වය පිළිබඳ ඇල්මක් ඇති කිරීම, භික්ෂු ජීවිතය පිළිබඳ යහපත් ආකල්ප ගොඩනැගීම සහ වත් පිළිවෙත් පිළිබඳ දැනුමෙන් සරු භික්ෂූන් වහන්සේ නමක් බිහි කිරීම සාමණේර ආයතනයක අරමුණ වී තිබේ. දසධම්ම සූත්‍රයෙන් නිරූපිත සම්පූර්ණ භික්ෂූන් වහන්සේ නමක් සමාජයට දායාද කිරීම, භික්ෂු ජීවිතය බෞද්ධ පිළිවෙත් අනුව සකස් වූ ජීවිතයක් බව අවබෝධ කර දීම, භික්ෂූන් වහන්සේ හා ගිහියා අතර වෙනස හා භික්ෂුත්වයේ උත්තරීතර භාවය අවබෝධ කරවීම, වෙනත් කෙනෙකුට බරක් නොවී භික්ෂු ජීවිතය ගත කළ යුතු ආකාරය උගැන්වීම සාමණේර අධ්‍යාපනයෙන් සිදු කරනු ලැබේ.

ආධාර ලැබීමට තිබිය යුතු අවශ්‍යතා

I. දහම් පාසල හැරුණු විට වෙනත් අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන නොයනු ලබන විහාරස්ථානයක් විය යුතුය.

II. තුන් බෝධිය තිබිය යුතුය.

III. අධ්‍යාපනය ලබන සාමණේර හිමිවරුන් නේවාසිකව වැඩ විසිය යුතුය.

IV. නේවාසිකව වැඩ විසීම සඳහා අවශ්‍යතා ලැගුම් ගෙවල්, ජලය, විදුලිය, වැසිකිළි ආදි මූලික අවශ්‍යතා තිබිය යුතුය.

V. උදෑසන හා දවල් දානය ප්‍රමාණවත් පරිදි ලැබෙන දායක පිරිස් සහිත විහාරස්ථානයක් විය යුතුය.

VI. කුඩා සාමණේර හිමිවරුන් පුහුණු කරවීමට උගත්, සිල්වත් උපසපන් උපාධ්‍යායන් වහන්සේ නමක් සිටිය යුතුය.

2020 වසරේ මූල්‍යාධාර ලබා දුන් සාමණේර ආයතන

අනු අංකය	ආයතනය (නම/ලිපිනය)	ආයතනයේ සිටින සාමණේර හිමිවරු ගණන	ලබා දුන් ආධාර මුදල
01	කටුගස්තොට ශ්‍රී සුධම්මානන්ද සාමණේර ආයතනය	14	රු. 10,000
02	කුරුවිට සිරි සුමංගල සාමණේර ආයතනය	11	රු. 100,000
03	වැල්ලවාය සිරි සුමනසාමණේර ආයතනය	15	රු. 90,000
04	තංගල්ල සිරි අරියවංශසාමණේර ආයතනය	08	රු. 120,000
05	ගාල්ල විද්‍යාදීපසාමණේර ආයතනය	05	රු. 50,000
06	සියඹලාණ්ඩුව ශ්‍රී සරණංකර සාමණේර ආයතනය	15	රු. 95,000
07	මිද්දෙණිය ශ්‍රී වජිරාරාමය සාමණේර ආයතනය	11	රු. 97,500
08	දඹුල්ල ශ්‍රී ජිනරතන සාමණේර ආයතනය	08	ශිෂ්‍ය නාමලේඛනය අසම්පූර්ණ වීම
09	කොටපොල ශ්‍රී සරණානන්ද සාමණේර ආයතනය	12	රු. 52,500
10	හන්තාන සිරි ධම්මරතන සාමණේර ආයතනය	15	උපාධ්‍යායන් වහන්සේ විදේශ ගත වී සිටීම
11	මහනුවර සිරි ධම්මපාලසාමණේර ආයතනය	06	උපාධ්‍යායන් වහන්සේ විදේශ ගත වී සිටීම සහ රෝගාතුර වීම

නාමලේඛන අසම්පූර්ණ වීම මත ඒවා නිවැරදි කිරීමට හැකිවුවද සමහර ශිෂ්‍යයින් ප්‍රතිචාර නොලැබීම මත සාමණේර ආයතන ක්‍රියාත්මක නොවීම යනාදී හේතු මත ලියාපදිංචි කළ සාමණේර ආයතන 3 ක් වෙනුවෙන් ගෙවීම් කළ නොහැක.

මෙම වසරේ පියවර 4 ක් යටතේ සියළු සාමණේර ආයතන පරික්ෂා කිරීමට කටයුතු සංවිධානය කර තිබුණද කොවිඩ් -19 රෝග තත්වය හමුවේ එය සිදුකිරීමට නොහැකි විය.

2.1.2 සාමණේර ආයතන වර්ෂාවසාන පරීක්ෂණ පැවැත්වීමේ වැඩසටහන

බුද්ධශාසන අරමුදල පිහිටු වීමෙන් පසු ආරම්භ කළ ඵලදායී ව්‍යාපෘතියක් ලෙස මෙම සාමණේර අධ්‍යාපන වැඩසටහන පැහැදිලිව හඳුනාගත හැකි වේ. කුඩා සාමණේර හිමිවරුන්ට භික්ෂුත්වය පිළිබඳ ඇල්මක් ඇති කිරීම, භික්ෂූන් වහන්සේගේ ජීවිතය පිළිබඳව යහපත් ආකල්ප ගොඩනැගීම සහ වත්පිළිවෙත් පිළිබඳ දැනුමෙන් සරු භික්ෂූන් වහන්සේ නමක් බිහි කිරීම සාමණේර ආයතනයක අරමුණ වේ.

මෙකී අරමුණු ඔස්සේ පුරුදු පුහුණු වූ සාමණේර හිමිවරුන්ගේ දැනුම හා ආකල්ප පිළිබඳ පරීක්ෂා කර බැලීමක් සිදු කෙරේ. ඒ අනුව පුහුණුව ප්‍රමාණවත්ව ලැබීමෙන් පසු සෑම වසරක් අවසානයේ දී බුද්ධශාසන අරමුදල විසින් පවත්වනු ලබන අවසාන විභාගයට සාමණේර භික්ෂූන් වහන්සේලාට පෙනී සිටිය හැකි වේ. මෙම ඇගයීමේ දී ලිඛිත පරීක්ෂණයක් මෙන්ම ප්‍රායෝගික හැකියාව පිළිබඳව පරීක්ෂණයක් ද නායක ස්වාමීන්වහන්සේලාගෙන් සමන්විත පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කෙරේ. මෙම පරීක්ෂණයෙන් විශිෂ්ට හා අධිශ්‍රේණියේ සාමාර්ථ ලබා ගන්නා සාමණේරයන් වහන්සේලාට විශේෂ ඇගයීමක් බුද්ධශාසන අරමුදල මඟින් සිදු කෙරේ.

ක්‍රියාත්මක ක්‍රමවේදය

I. ලියාපදිංචි කර ඇති සාමණේර ආයතන වලින් විභාගය සඳහා අයදුම් පත්‍ර කැඳවීම
II. විභාග කටයුතු සංවිධානය කිරීම
III. විභාගය පැවැත්වීම
IV. ශිෂ්‍යත්ව ලබා දීම

2020 වසරේදීකොවිඩ්- 19 රෝග තත්ත්වය හමුවේ එක් ස්ථානයකට භික්ෂූන් වහන්සේලා එක්රැස් කිරීමට නොහැකි වූ බැවින් මෙම පරීක්ෂණය පවත්වා නැත.

2.1.3 සාමණේර භික්ෂූන් වහන්සේලා උදෙසා ක්‍රියාත්මක ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමය

බුදු දහමේ චිර පැවැත්ම උදෙසා නවක භික්ෂූන් වහන්සේලා ශාසනයට ඇතුළත් වීම අත්‍යවශ්‍ය වන අතර එසේ පැවිදි වන වයස අවුරුදු 18 ට අඩු හා 2014 සැප්තැම්බර් මාසයෙන් පසු පැවිදිබිමට පත්වූ සාමණේර භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපන හා වෙනත් ප්‍රත්‍ය පහසුකම් වෙනුවෙන්මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර ඉහත සුදුසුකම් සපිරි සාමණේර ස්වාමීන් වහන්සේලා වැඩවාසය කරන විහාරස්ථාන හෝ ආරණ්‍ය සේනාසන මගින් ඉල්ලීම් ලිපි ඉදිරිපත් කළ හැක. මෙහිදී එක් සාමණේර භික්ෂූන් වහන්සේ නමක් වෙනුවෙන් මසකට රු 1000 බැගින් අවුරුදු 3 ක කාලයක් මෙම දීමනාව ලබා දීම සිදුවේ.

සාමණේර ස්වාමීන් වහන්සේලාගේ 2020 දෙසැම්බර් මස 31 දිනට ගෙවීම් සාරාංශය

අනු අංකය	දිස්ත්‍රික්කය	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
1.	කොළඹ	36	36	36	36	36	34	34	34	34	34	54	54
2.	ගම්පහ	118	118	118	118	118	114	114	114	114	114	119	119
3.	කළුතර	49	44	44	44	44	43	43	43	43	43	102	102
4.	මහනුවර	35	28	28	28	28	25	25	25	25	25	28	28
5.	මාතලේ	22	22	22	22	22	22	22	10	10	10	10	10

6.	ගාල්ල	58	58	58	58	58	55	55	52	52	52	50	49
7.	මාතර	91	90	90	90	90	87	87	85	85	85	94	94
8.	හම්බන්තොට	39	38	38	38	38	37	37	36	36	36	47	47
9.	අම්පාර	20	20	20	20	20	20	20	13	13	13	17	17
10.	කුරුණෑගල	22	22	22	22	22	22	22	22	22	22	38	38
11.	පුත්තලම	14	14	14	14	14	14	14	14	14	14	15	15
12.	අනුරාධපුරය	30	30	30	30	30	22	22	22	22	22	29	29
13.	පොළොන්නරුව	05	05	05	05	05	04	04	04	04	04	06	06
14.	නුවරඑළිය	-	-	-	-	-	-	-	-	-	-	03	03
15.	බදුල්ල	71	70	70	70	70	63	63	60	60	60	71	71
16.	මොණරාගල	32	32	32	32	32	32	32	31	31	31	48	48
17.	රත්නපුර	44	43	43	43	43	43	43	37	37	37	38	38
18.	කෑගල්ල	66	66	66	66	66	61	61	58	58	58	62	62
	මුළු සංඛ්‍යාව	752	736	736	736	736	698	698	660	660	660	831	830

2020 වර්ෂය තුළ මෙහි ගෙවීම් සඳහා රු 6,816,856/- වැය කර ඇත. මෙම මුදලට තැපැල් කාර්යාල ගාස්තු ද අයත්වේ. ඇතැම් හිමිවරු උපැවිදිවීම, වයස අවරුදු 18 සම්පූර්ණ විම හා අවුරුදු 3 ක ගෙවීම් කාලය අවසන් වීම යන කරුණු මත ඇතැම් මාස වල සිට ගෙවීම් නවතා ඇත. සුදුසුකම් සහිත නව හිමිවරු ගෙවීම් ලේඛනයට වරින් වර ඇතුළත් කර ඇත.

2.1.4 භික්ෂු වෛද්‍යාධාර වැඩසටහන

ශ්‍රී ලංකාව පුරා වැඩ සිටින භික්ෂූන් වහන්සේලා සහ දස සිල් මාතාවන් උදෙසා වෛද්‍යාධාර ක්‍රමයක් බුද්ධශාසන අරමුදල මඟින් ක්‍රියාත්මක කෙරේ. 2559 වෙනි වෛශාඛ්‍ය මංගල්‍ය නිමිති කොටගෙන දිවයින පුරා වැඩ සිටින භික්ෂූන් වහන්සේලා සහ දස සිල් මාතාවන් රෝගාතුර වීම් වලදී අවශ්‍ය වන වෛද්‍ය පහසුකම් සඳහා ආධාර ලබා දීම මෙමගින් සිදු කෙරේ.

මෙහිදි දිවයින පුරා වැඩසිටින සුදුසුකම් ලත් භික්ෂූන් වහන්සේලා සහ දස සිල් මාතාවන් ප්‍රාදේශීය ලේකම් හා බෞද්ධ කටයුතු සමායෝජකගේ නිර්දේශයන් හා වෛද්‍ය නිර්දේශ සහිතව තෝරා ගනිමින් භික්ෂූන් වහන්සේලා සහ දස සිල් මාතාවන්වෙත කෙටි කාලීන සහ දීර්ඝ කාලීන රෝග සඳහා මුදල් ලබා දීම මෙමගින් සිදු කෙරේ. රෝගයේ ස්වභාවය අනුව රු. 3000/=ක මුදලක් හෝ විශේෂ රෝග හෝ ශල්‍ය කර්මවලට භාජනය වූ අය සඳහා ද අසාධ්‍ය රෝග සඳහා ද රු.5000/= බැගින් ජීවිත කාලයටම මූල්‍යාධාර ගෙවීම සිදු කෙරේ.

2020 වර්ෂයේ ලබා දුන් ආධාර පිළිබඳ තොරතුරු.

අනු අංකය	ස්වාමීන් වහන්සේ/ දස සිල් මාතාවගේ නම	ලබා දුන් වාර්ෂික මුදල
01	පූජ්‍ය වැලිගමුවේ සුසීම හිමි	60,000.00
02	පූජ්‍ය වල්ගොව්වාගොඩ විමලබුද්ධි හිමි	60,000.00
03	පූජ්‍ය පිලානේ ජයශාන්ත හිමි	60,000.00
04	පූජ්‍ය ආඳාඋල්පත බුද්ධසාර හිමි	60,000.00
05	පූජ්‍ය දොඩම්ගොල්ලේ පුඤ්ඤරතන හිමි	60,000.00
06	පූජ්‍ය අත්තිඩියේ විජිතසිරි හිමි	60,000.00
07	පූජ්‍ය දුටුවැවේ ජිනානන්ද හිමි	60,000.00
08	පූජ්‍ය විහාරහල්මිල්ලෑවේ ධම්මරක්ඛිත හිමි	60,000.00
09	පූජ්‍ය ජයන්තිපුර ධම්මපාලි සිල්මාතාව	60,000.00
10	පූජ්‍ය සෑගල සුමේධ හිමි	60,000.00
11	පූජ්‍ය මැදමුලනේ රතනපාල හිමි	60,000.00
12	පූජ්‍ය මුදියල ධම්මජෝති හිමි	60,000.00
13	පූජ්‍ය දාගම සීලානන්ද හිමි	60,000.00
14	පූජ්‍ය ඇටඹගස්කඩ සද්ධානන්ද හිමි	60,000.00
15	පූජ්‍ය මුරුගම්පල රතනසාර හිමි	60,000.00
16	පූජ්‍ය ගිරාගම ධම්මාලෝක හිමි	60,000.00
17	පූජ්‍ය ගැටමාන්නේ ලංකානන්ද හිමි	60,000.00
18	පූජ්‍ය ගැටමාන්නේ සාසනරතන හිමි	60,000.00
19	පූජ්‍ය පනාවල ධම්මින්ද හිමි	60,000.00
20	පූජ්‍ය දෙද්දූවාවල අමරවංශ හිමි	60,000.00
21	පූජ්‍ය ගිරිතලානේ ධම්මසිරි හිමි	60,000.00
22	පූජ්‍ය මිද්දෙණියේ ඤාණරතන හිමි	60,000.00
23	පූජ්‍ය වාන්ඇල බක්කුල හිමි	60,000.00
24	පූජ්‍ය පලුගස්වැවේ ඤාණරතන හිමි	60,000.00
25	පූජ්‍ය කන්නට්යේ ඤාණරතන හිමි	60,000.00
26	පූජ්‍ය තල්කොටේ සුසීම හිමි	60,000.00
27	පූජ්‍ය තලගම රාහුල හිමි	60,000.00
28	පූජ්‍ය දිගන්හල්මිල්ලෑවේ අරියධම්ම හිමි	60,000.00
29	වැලිවිට ධම්මානන්ද සිල්මාතාව	60,000.00

30	පූජ්‍ය විටියල ධම්මරතන හිමි	60,000.00
31	පූජ්‍ය සපුතන්තිරිනක්දේ සුමංගල හිමි	10,000.00
32	පූජ්‍ය අඹතැන්නේ ධම්මකිත්ති හිමි	60,000.00
33	ගාල්ලේ ශීලා ධම්මචාරිනි මෙහෙණින් වහන්සේ	60,000.00
34	පූජ්‍ය ගොඩිගමුවේ සෝමානන්ද හිමි	60,000.00
35	දෙනගම ධම්ම සුභා සිල්මාතාව	60,000.00
36	පූජ්‍ය මඩුගල්ලේ ශ්‍රී සිද්ධාර්ත හිමි	60,000.00
37	පූජ්‍ය ඉඹුල්පිටියේ වජිරධම්ම හිමි	35,000.00
38	පූජ්‍ය ගලහිටියේ සිරිපදුම හිමි	21,000.00
39	පූජ්‍ය වකමුල්ලේ චන්දවිමල හිමි	21,000.00
40	කටුවන සුභද්‍රා සිල්මාතාව	21,000.00
41	පූජ්‍ය වැලිගම ධම්මශීලා සිල්මාතාව	15,000.00
42	පූජ්‍ය මුරුතමුරේ ධම්මමිත්තා සිල්මාතාව	15,000.00
43	පූජ්‍ය නාවලපිටියේ ධම්මශෝභා සිල්මාතාව	12,000.00
44	පූජ්‍ය හොරේවෙල ධම්මචාරී සිල්මාතාව	15,000.00
45	පූජ්‍ය ගලහිටියේ සිරිපදුම හිමි	15,000.00
46	පූජ්‍ය ත්‍රිකුණාමලයේ සමිතවංශ හිමි	15,000.00
47	පූජ්‍ය හිරල්ලුගම විජයරතන හිමි	15,000.00

2020 වර්ෂයේ භික්ෂු වෛද්‍යාධාර සඳහා වැය වූ මුලු මුදල **රු.2,310,000/-** කි.

2.1.5 බුදුපුත් සුරක්ෂා සෞඛ්‍ය ආරක්ෂණ වැඩසටහන

මුළු දිවයිනම ආවරණය වන පරිදි වෙනත් රක්ෂණ ක්‍රමයකින් ආවරණය නොවන සියළුම ලියාපදිංචි භික්ෂූන් වහන්සේලාගේ රෝහල් ගත වීම උදෙසා පිරිනැමෙන වෛද්‍යාධාර ක්‍රමයකි. මේ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ භික්ෂූන් වහන්සේලා ලියාපදිංචි කර ගනිමින් හිමිකම් පත් නිකුත් කිරීම සිදු වේ. ලියාපදිංචිය ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිටින බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන් වෙතින් නියමිත ආකෘති පත්‍රයක් ලබා ගෙන, සම්පූර්ණ කරන ලද අයදුම්පත බෞද්ධ කටයුතු සමායෝජක, ප්‍රාදේශීය ලේකම් මඟින් අමාත්‍යාංශයට එවිය යුතුය. එහිදි තොරතුරු සනාථ කර ගැනීමෙන් අනතුරුව ලියා පදිංචි කර ගැනීම සිදු කෙරේ.

ඉන් අනතුරුව හිමිකම් අංකයක් නිකුත් කරන අතර රෝහල් ගත වීම් වලින් අනතුරුව වැය වූ මුදල් ලබා ගැනීම සඳහා හිමිකම් ඉල්ලුම්පත අදාල වෛද්‍ය සහතිකද සමඟ බෞද්ධ කටයුතු සමායෝජක, ප්‍රාදේශිය ලේකම් මගින් ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව හිමිකම් ගෙවීම් සිදුවේ.

මේ ආකාරයට 2020/12/31 දිනට ලියාපදිංචි භික්ෂූන් වහන්සේලාසංඛ්‍යාව 8634 කි. 2019/10/01 දින සිට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. එදින සිට ඉදිරිපත් වූ හිමිකම් ඉල්ලීම සඳහා ගෙවීම් සිදු කර ඇත.

ගෙවීම් සම්බන්ධ තොරතුරු

2020.12.11 දිනට ලියාපදිංචි භික්ෂූන් වහන්සේලා සංඛ්‍යාව- 8634

ගෙවා ඇති හිමිකම් ඉල්ලීම් ගණන	- 09 (ව්‍යාපෘතිය මගින්),
	- 05 (පෞද්ගලික පාර්ශව මගින්)
ගෙවා ඇති මුදල	- රු.36,108/- (පෞද්ගලික පාර්ශව)

2.1.6 වයස්ගතව පැවිදි වූ භික්ෂූන් වහන්සේලාට ප්‍රායෝගික පුහුණුව ලබා දීම

ගිහි ජීවිතයේ කාලයක් ගත කර වයස්ගතව පැවිදි ජීවිතයට ඇතුළත්වන ස්වාමීන්වහන්සේලා වැඩි වෙමින් පවතින ප්‍රවනතාවයක් ඇත. එවැනි හිමිවරුන් පැවිදි ජීවිතය පිළිබඳව මනා අවබෝධයකින් තොරව හැසිරෙන බැවින් බෞද්ධ සැදැහැවතුන්ගේ කලකිරීමටත් විවේචනයටත් භාජනය වූ අවස්ථා තිබේ. එසේම ශාසනයට අහිතකර බොහෝ දෑ කිරීමට පෙළඹීම නිසා සමාජ දෝෂ දර්ශනයට ලක්වන අවස්ථාද දැකිය හැකිය. එබැවින් එවැනි හිමිවරුන්ට පැවිදි ජීවිතයේ ඇති උත්තරීතර භාවය හා ගිහි පැවිදි වෙනස පිළිබඳව මූලික වත්පිළිවෙත් හා ධර්මානුකූල දැනුමක් ද ලබාදීම අරමුණු කර ගනිමින් මෙම වැඩමුළුව පැවැත්වේ.

දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් මඟින් අදාළ බල ප්‍රදේශයේ විහාරස්ථානවල වැඩ සිටින ළමාවිය ඉක්මවා පැවිදි වූ භික්ෂූන් වහන්සේලාගේ පිළිබඳ තොරතුරු කැඳවා ගනු ලබයි. ලැබෙන තොරතුරු මත දිස්ත්‍රික්කයක් තුළ වැඩසටහන්පැවැත්වීම අපේක්ෂා කෙරේ. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරීන්ගේ සහය ලබාගෙන උක්ත වැඩසටහන අදාළ දිස්ත්‍රික්කය තුළදී සංවිධානය කරනු ලබන අතර, එක් වැඩසටහනත් සඳහා අවම භික්ෂූන් වහන්සේලා 10 නමක් අපේක්ෂා කෙරේ.

2020 වසරේ පැවැත්වූ වැඩසටහන් පිළිබඳ තොරතුරු

දිස්ත්‍රික්කය	රත්නපුර
ස්ථානය	පැල්මඩුල්ල පාතකඩ භික්ෂු පුහුණු මධ්‍යස්ථානය
මෙහෙයවීම	බුද්ධශාසන අරමුදල/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
පැවැත්වූ දින ගණන	03
සහභාගී වූ හිමිවරු සංඛ්‍යාව	29
වැය කල මුදල	රු. 112, 570

කොරෝනා රෝග තත්ත්වය මත සැලසුම් කළ ඉතිරි වැඩ සටහන් පැවැත්වීමට නොහැකි විය.

2.1.7 දුෂ්කර විහාරස්ථාන සඳහා සනීපාරක්ෂක පහසුකම් සඳහා ආධාර ලබා දීම

දිවයින පුරා පිහිටි විහාරස්ථාන අතුරින් මූලික පහසුකම්වත් සම්පූර්ණ නොවූ විහාරස්ථාන රාශියක් දක්නට ලැබේ. අවම පහසුකම් සම්පූර්ණ නොවූ එම විහාරස්ථානවල වැඩ සිටින භික්ෂූන් වහන්සේලාගේ සනීපාරක්ෂක පහසුකම් දියුණු කර ගැනීම සඳහා අවස්ථා සලසාදීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

දුෂ්කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තෝරා එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ප්‍රමුඛතා ලේඛනය අනුව සැකසූ වාර්තාවක් අනුව විහාරස්ථාන තෝරාගැනීම හා ඍජුව බුද්ධශාසන අරමුදල මඟින් කෙරෙන ඉල්ලීම් ද ප්‍රාදේශීය ලේකම්/ බෞද්ධ කටයුතු සමායෝජකගේ නිර්දේශය සහිතව තෝරාගෙන පාලක මණ්ඩල අනුමැතියෙන් මූල්‍යාධාර ලබාදීම සිදු කෙරේ.

2020 වර්ෂයේ දී මූල්‍යාධාර ලබා දුන් විහාරස්ථාන

අනු අංකය	විහාරස්ථානයේ නම හා ලිපිනය	ආධාර ලබාදුන් ව්‍යාපෘතිය	ලබා දුන් මුදල
1.	ශ්‍රී සුභද්‍රාරාම පුරාණ විහාරස්ථානය	වැසිකිළියක් ඉදිකිරීම සඳහා	100,000.00
2.	ශ්‍රී ධර්මපාල ආරණ්‍ය සේනාසනය	වැසිකිළියක් ඉදිකිරීම සඳහා	100,000.00
3.	වැලිගම අග්‍රබෝධි රජමහා විහාරය	වැසිකිළියක් ඉදිකිරීම සඳහා	100,000.00
4.	ශ්‍රී ලෙනගිරි විහාරස්ථානය	වැසිකිළියක් ඉදිකිරීම සඳහා	100,000.00
5.	ධර්ම විජයරාම විහාරස්ථානය	වැසිකිළියක් ඉදිකිරීම සඳහා	100,000.00
6.	වරකාපොළ විවේකාශ්‍රම බෞද්ධ මධ්‍යස්ථානය	වැසිකිළියක් ඉදිකිරීම සඳහා	100,000.00
7.	ගලිගමුවේ ධම්රජ විහාරස්ථානය	වැසිකිළියක් ඉදිකිරීම සඳහා	100,000.00
8.	ගලිගමුවේ ශ්‍රී සුගත බිම්බාරාම විහාරස්ථානය	වැසිකිළියක් ඉදිකිරීම සඳහා	100,000.00
9.	විකාදෙණිගම ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති විහාරස්ථානය	වැසිකිළියක් ඉදිකිරීම සඳහා	100,000.00
10.	මාකුර රජමහා විහාරස්ථානය	වැසිකිළියක් ඉදිකිරීම සඳහා	100,000.00
11.	බෝධිරාජ විහාරස්ථානය	වැසිකිළියක් ඉදිකිරීම සඳහා	100,000.00
12.	බෝධිමළු විහාරස්ථානය	වැසිකිළියක් ඉදිකිරීම සඳහා	100,000.00
	එකතුව		**1200,000.00**

2.1.8 භාෂා හා සංස්කෘතික අධ්‍යාපන පාඨමාලා පැවැත්වීමේ වැඩසටහන

භික්ෂූන් වහන්සේලාට චීන බස මනාසේ උගෙන ථේරවාද හා මහායාන බුදු දහම පිළිබඳව තුලනාත්මක අධ්‍යනයක් කිරීමට අවස්ථාවක් ලබා දීමේ අරමුණින් ආරම්භ කර තිබූ "චීන භාෂා අධ්‍යයන ආයතන පිහිටුවීම" යන ව්‍යාපෘතියට සවිශක්තියක් වෙමින් බුද්ධශාසන අරමුදලේ 84 වන පාලක මණ්ඩල රැස්වීමේ දී චීන භාෂාවට අමතරව වෙනත් භාෂා ඉගැන්වීමේ අරමුණින් පොදුවේ **"භාෂා අධ්‍යයන ආයතන පිහිටුවීම"** ලෙස ව්‍යාපෘතියේ නම සංශෝධනය කර දෙමළ භාෂාවට මුල් තැන දෙමින් කටයුතු කරන ලෙස තීරණය විය. උතුරු නැගෙනහිර පළාත්වල ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ධර්මය හැදෑරීමට කැමති ධර්මාභිලාෂී විශාල

පිරිසක් සිටින අතර ඒ අයට දමිළ බසින් ධර්මය ප්‍රචාරය කිරීමට භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රමුඛ අරමුණ වේ.

පොදුවේ භාෂා අධ්‍යයන ආයතන පිහිටුවීම තුළින් භාෂා අධ්‍යයනයට ඇල්මක් දක්වන, විදෙස් බසින් බෞද්ධාගමිකයන්ට හා බෞද්ධාගමට ප්‍රිය කරන්නා වූ දෙස් විදෙස් ජනතාවට ධර්ම ප්‍රචාරණය කිරීමත් මනාසේ ඇල්මක් දක්වන භික්ෂූන් වහන්සේලා උදෙසා මෙමගින් අනගි අවස්ථාවක් උදාවන අතර එම ස්වාමින්වහන්සේලා මතුයම් දිනක මෙම දැනුම ඔස්සේ යමින් සම්බුද්ධශාසනයේ චිරස්ථිතිය උදෙසා කටයුතු කරනු ඇතැයි යන පරමාර්ථයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

ඕනෑම විහාරස්ථානයක භාෂා අධ්‍යයන ආයතනයක් පිහිටුවීමට අදහස් කරන්නේනම් ඉල්ලීම් ලිපියක් එවූ පසු ඊට අදාළව සකස් කරන ලද අයදුම්පතක් බුද්ධශාසන අරමුදල වෙතින් ලබා ගෙන එය සම්පූර්ණ කළ යුතුය. සම්පූර්ණ කර එවන ලද අයදුම්පත්වලට අදාළ ස්ථාන නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව බුද්ධශාසන අරමුදලේ පාලක මණ්ඩල අනුමැතියට යටත්ව එම භාෂා අධ්‍යයන ආයතනයේ ඉගැන්වීම් කටයුතු සිදු කරන ආචාර්ය ස්වාමීන්වහන්සේ හෝ ආචාර්යවරයාගේ දේශක දීමනා ගෙවීම, භාෂා අධ්‍යයන ආයතනයට අවශ්‍ය පුස්තකාල, කාර්යාල උපකරණ වැනි පහසුකම් සැපයීම, අවශ්‍ය පමණට පෙළපොත් මුද්‍රණය හෝ ඇස්තමේන්තුවක් එවූ පසු පෙළපොත් මුද්‍රණයට අවශ්‍ය මූල්‍යමය දායකත්වය සැපයීම මගින් පාඨමාලාව පවත්වාගෙන පාඨමාලාව අවසානයේ පරීක්ෂණයෙන් සමත්වන සිසුන්හට සහතික පත්‍ර නිකුත් කිරීම සිදු කළ හැකිය. ඊට අමතරව වරින් වර බුද්ධශාසන අරමුදලේ ලේකම් සහ නිලධාරීන්ගෙන් සැදුම්ලත් නිලධාරි මඩුල්ලකගේ සහභාගීත්වයෙන් භාෂා අධ්‍යයන ආයතනය නිරීක්ෂණ කටයුතු සිදු කෙරේ.

චීන භාෂා පාඨමාලාව සම්බණ්ධ තොරතුරු

- 2020 මාර්තු මස සිට කොවිඩ් 19 වසංගත තත්ත්වය මත හා නිරෝධායන ඇඳිරි නීතිය හේතුවෙන් දෙවන කණ්ඩායම සඳහා චීන භාෂා පාඨමාලාවේ පළමු අදියර පාඨමාලාව තාවකාලිකව නැවැත්වීමට සිදුවූ අතර එහි ඉතිරි කොටස 2020 ජුලි මස සිට නැවත ආරම්භ කරන ලදි.

- දෙවන කණ්ඩායමේ පළමු අදියර චීන භාෂා පාඨමාලාව ජුලි මාසයෙන් අවසන් විය.

ස්ථානය	කැළණිය, පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන
ආයතනාධිපති	පූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම හිමි
සම්බන්ධීකරණය	පූජ්‍ය උඩගලාදෙණියේ ධම්මාධාර හිමි
මෙහෙයවීම	මහාචාර්ය හාඕ වෙමිනින් මහතා
කණ්ඩායම හා පාඨමාලාව	දෙවන කණ්ඩායමේ පළමු අදියර පාඨමාලාව
ශිෂ්‍ය සංඛ්‍යාව (ගිහි පැවිදි දෙපාර්ශවයම)	102

2.2 ඉදිරි ඉලක්ක

2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්

අනු අංකය	වැඩසටහන	2021 ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත ඉලක්ක.
1	සාමණේර ආයතන සංවර්ධනයට මූල්‍යාධාර සැපයීම හා පරීක්ෂා කිරීම	20

2	සාමණේර ආයතන සමාප්ති පරීක්ෂණය	01
3	සම්බුද්ධත්වජයන්ති සාමණේරකැපකරු ශිෂ්‍යාධාර යෝජනා ක්‍රමය	1500
4	භික්ෂු වෛද්‍යාධාර වැඩසටහන	30
5	බුදුපුත් සුරක්ෂා සෞඛ්‍ය ආරක්ෂණ වැඩසටහන	රෝහල් ගතවීම් වලට අනුව ඉල්ලීම් මත ගෙවීම් සිදුවේ.
6	වයස්ගතව පැවිදි වූ ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම	04
7	දුෂ්කර විහාරස්ථාන සඳහා සනීපාරක්ෂක පහසුකම් ලබාදීම	50
8	භාෂා හා සංස්කෘතික අධ්‍යාපන පාඨමාලා පැවැත්වීමේ වැඩසටහන	02
9	අ.වු 90 ට වැඩි ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් මුල්‍යාධාර ලබාදීම	20
10	සාමණේර ආයතන හා දහම්පාසැල් සඳහා පුස්තකාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	04

03 පරිච්ඡේදය

2020 වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශය

බුද්ධශාසන අරමුදල
2020.12.31 දිනට ශේෂ පත්‍රය

	සටහන	බුද්ධශාසන අරමුදල 2020	බිදුපුත් සුරක්ෂා 2020	එකතුව 2020	2019
		රු.	රු. ශ.	රු. ශ	රු. ශ.
වත්කම්					
ස්ථාවර වත්කම්	1	9,973,803.00	-	9,973,803.00	10,093,417.00
ආයෝජන	2	647,499,933.99	90,000,000.00	737,499,933.99	559,016,241.62
ශුද්ධ ජංගම වත්කම්	3	71,845,742.85	8,247,392.00	80,093,134.85	109,001,484.81
බිදුපුත් සුරක්ෂා අරමුදලේ ආයෝජනය		90,000,000.00	-	-	-
		819,319,479.85	**98,247,392.00**	**827,566,871.85**	**678,111,143.43**
මෙයින් නියෝජනය වන්නේ;					
බුද්ධ ශාසන අරමුදල		761,498,417.67	98,247,392.00	769,745,809.67	669,290,081.25
විවිධ පරිත්‍යාග	4	6,472,266.18	-	6,472,266.18	7,472,266.18
සුනාමි ආධාර		1,348,796.00	-	1,348,796.00	1,348,796.00
බිදුපුත් සුරක්ෂා අරමුදල සඳහා රජයේ දායකත්වය		50,000,000.00	-	50,000,000.00	-
		819,319,479.85	**98,247,392.00**	**827,566,871.85**	**678,111,143.43**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සකස් කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම සඳහා බුද්ධ ශාසන අරමුදලේ ඉදිරියේ රැස්වනු ලබන පළමු පාලක මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.

බුද්ධ ශාසන අරමුදලේ 2020.12.31 දිනට ඉදිරිපත් කර ඇති ශේෂ පත්‍රය සහ ගිණුම් ප්‍රකාශන සම්බන්ධ වගකීම බුද්ධ ශාසන අරමුදලේ පාලක මණ්ඩලය සතු වන්නේය.

ඩබ්.එම්.ඊ.කවිත් ගුණවර්ධණ
ගණකාධිකාරී
බුද්ධශාසන අරමුදල

ඩබ්. එම්. ඊ. කවිත් ගුණවර්ධන
ගණකාධිකාරී
බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය
'දහම්පාය'

කේ.චතුර මිහිදුම්
ලේකම්
බුද්ධශාසන අරමුදල

කේ. චතුර මිහිඳුම්
ලේකම්
බුද්ධශාසන අරමුදල
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමා.
"දහම්පාය"
අංක 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත
කොළඹ 07.

සෝමරත්න විදානපතිරණ
ලේකම්
බුද්ධශාසන අමාත්‍යාංශය
බුද්ධශාසන අරමුදලේ
පාලක මණ්ඩල සාමාජික

එම්.නාලිකා පී.ගුණරත්න
මහාභාරකාර තැන (රා.ගු)
බුද්ධශාසන අරමුදලේ
පාලක මණ්ඩල සාමාජික

එම්. නාලිකා පී. ගුණරත්න
ශ්‍රී ලංකාවේ මහා භාරකාරතැන (රා.ගු.)
මහා භාරකාර දෙපාර්තමේන්තුව
අංක 02. බුලර්ස් පටුමග,
කොළඹ 07.

බුද්ධශාසන අරමුදල
2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් වියදම් ගිණුම

	සටහන	බුද්ධශාසන අරමුදල 2020	බුදුපුත් සුරක්ෂා 2020	එකතුව 2020	2019
		රු ශ	රු ශ	රු ශ	රු ශ
ආදායම්					
ආයෝජන ආදායම්	5	53,739,360.99	1,192,500.00	54,931,860.99	57,248,998.25
ධර්ම ග්‍රන්ථ අලෙවියෙන් ලාභ	6	612,149.22	-	612,149.22	275,592.60
පරිත්‍යාග සහ වෙනත් ආදායම්	4	19,000.00	7,431,000.00	7,450,000.00	25,500.00
මුළු ආදායම් එකතුව		**54,370,510.21**	**8,623,500.00**	**62,994,010.21**	**57,550,090.85**
අඩුකළා : ව්‍යාපෘති වියදම්					
සාමණේර ආයතන ආධාර		942,628.00	-	942,628.00	1,292,500.00
සාමණේර ආයතන - අධීක්ෂණ වියදම්		12,000.00	-	12,000.00	52,681.00
සාමණේර කැපකරු දායක වාරික මුදල්		8,186,973.00	-	8,186,973.00	4,083,145.00
භික්ෂු වෛද්‍යාධාර වියදම්		2,310,000.00	-	2,310,000.00	2,645,206.00
සනීපාරක්ෂක කටයුතු සඳහා මූල්‍යාධාර		1,200,000.00	-	1,200,000.00	299,920.00
සාමණේර ආයතන විභාග		-	-	-	580,354.00
වැඩිහිටි භික්ෂු ආකල්ප ප්‍රවර්ධන වැඩසටහනට වියදම්		112,570.00	-	112,570.00	256,555.00
විභා භාෂා පුහුණු වියදම්		94,500.00	-	94,500.00	352,210.00
වැලිපිටියේ පඤ්ඤාලෝක හිමියන්ගේ දේහය ලංකාවට ගෙන්වා ගැනීමට වියදම්.		500,000.00	-	500,000.00	-
ප්‍රතිලාභ ගෙවීම		-	376,108.00	376,108.00	-
පරිපාලන වියදම්					
ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා		-	-	-	23,100.00
පාලක මණ්ඩල පාරිශ්‍රමික දීමනා හා කාර්ය මණ්ඩල වැටුප්		28,760.00	-	28,760.00	58,151.00
ගමන් වියදම්		8,400.00	-	8,400.00	18,810.00
පරිගණක පුහුණු දීමනා		-	-	-	166,608.00
අතිකාල		16,191.00	-	16,191.00	54,536.00
සංග්‍රහ වියදම්		9,594.00	-	9,594.00	24,056.00
වෙනත් වියදම්		72,975.00	-	72,975.00	9,454.71
කාර්යාලීය වැටුප් හා දීමනා		83,054.74	-	83,054.74	-
විවිධ ක්ෂය වෙන්කිරීම්				-	-
සේප්පුව		4,310.00	-	4,310.00	4,310.00
ගොඩනැගිලි ඉදිකිරීම		87,500.00	-	87,500.00	87,500.00
ලී බඩු උපකරණ ක්ෂය		5,775.00	-	5,775.00	5,775.00
ශබ්ද විකාශන යන්ත්‍රය		5,735.00	-	5,735.00	5,735.00
උපකරණ සහ සවි කිරීම්		16,294.00	-	16,294.00	16,294.00
වියදම්වල එකතුව		**13,697,259.74**	**376,108.00**	**14,073,367.74**	**10,036,900.71**
වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(ඌණතාවය)		**40,673,250.47**	**8,247,392.00**	**48,920,642.47**	**47,513,190.14**

බුද්ධ ශාසන අරමුදල
2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	බුද්ධශාසන අරමුදල 2020	බිදුපුත් සුරක්ෂා 2020	එකතුව 2020	2019
	රු. ශ	රු. ශ	රු. ශ	රු. ශ
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය				
වර්ෂයේ ශුද්ධ අතිරික්තය	40,673,250.47	8,247,392.00	48,920,642.47	47,513,190.14
ගැලපීම්				
එකතු කළා - වර්ෂයේ ක්ෂය හර කිරීම	119,614.00	-	119,614.00	119,614.00
භාණ්ඩාගාර බිල්පත් අගය කපා හැරීම	-	-	-	-
කාරක ප්‍රාග්ධන වෙනස් වීමට පෙර ශුද්ධ ලාභය	40,792,864.47	8,247,392.00	49,040,256.47	47,632,804.14
කාරක ප්‍රාග්ධන වෙනස් වීම	10,576,991.60	-	10,576,991.60	(3,461,368.60)
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල්	51,369,856.06	8,247,392.00	59,617,248.06	44,171,435.54
මුදල් ගලනය වීම				
පරිත්‍යාග ලැබීම්	-	-	-	1,000,000.00
බිදුපුත් සුරක්ෂා අරමුදල සඳහා රජයේ දායකත්වය	50,000,000.00	-	50,000,000.00	-
පුනරුද අරමුදල	51,535,085.95	-	51,535,085.95	-
පරිත්‍යාග නිදහස් කිරීම	(1,000,000.00)	-	(1,000,000.00)	-
බිදුපුත් සුරක්ෂා අරමුදල සඳහා අරමුදලේ දායකත්වය	(90,000,000.00)	90,000,000.00	-	-
වර්ෂය තුළ මුදල් හා සමාන අයිතමයන්ගේ ශුද්ධ වැඩිවීම	**61,904,942.01**	**98,247,392.00**	**160,152,334.01**	**45,171,435.54**

	බුද්ධශාසන අරමුදල	බිදුපුත් සුරක්ෂා	එකතුව
වර්ෂය ආරම්භයේදී මුදල් හා සමාන අයිතමයන් (සටහන i)	611,094,067.04	-	611,094,067.04
වර්ෂය අවසානයේදී මුදල් හා සමාන අයිතමයන් (සටහන ii)	672,999,009.05	98,247,392.00	771,246,401.05

(සටහන i)

මුදල් හා මුදල් සමාන අයිතමයන්	බුද්ධශාසන අරමුදල 01.01.2020	බිදුපුත් සුරක්ෂා 01.01.2020	එකතුව 01.01.2020
ජංගම ගිණුම	52,077,825.42	-	52,077,825.42
ඉතිරි කිරීමේ ගිණුම	14,277,460.56	-	14,277,460.56
ස්ථාවර තැන්පත් හා භාණ්ඩාගාර බිල්පත්	544,738,781.06	-	544,738,781.06
	611,094,067.04	-	**611,094,067.04**

(සටහන ii)

මුදල් හා මුදල් සමාන අයිතමයන්	බුද්ධශාසන අරමුදල 31.12.2020	බිදුපුත් සුරක්ෂා 31.12.2020	එකතුව 31.12.2020
ජංගම ගිණුම	25,499,075.06	8,247,392.00	33,746,467.06
ඉතිරි කිරීමේ ගිණුම	17,302,408.61	-	17,302,408.61
ස්ථාවර තැන්පත් හා භාණ්ඩාගාර බිල්පත්	630,197,525.38	90,000,000.00	720,197,525.38
	672,999,009.05	**98,247,392.00**	**771,246,401.05**

බුද්ධශාසන අරමුදල
අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය

	බුද්ධශාසන අරමුදල රු. ශ	බුද්ධපුත් සුරක්ෂා රු. ශ	එකතුව රු. ශ
2019.01.01 දිනට බුද්ධ ශාසන අරමුදලේ ආරම්භ ශේෂය	**621,776,891.11**	-	**621,776,891.11**
එකතු කළා			
2019 වර්ෂයේ අරමුදලේ ශුද්ධ අතිරික්තය	47,513,190.14	-	**47,513,190.14**
2020.01.01 දිනට බුද්ධ ශාසන අරමුදලේ ආරම්භ ශේෂය	**669,290,081.25**	-	**669,290,081.25**
එකතු කළා			
බුද්ධ ශාසන අරමුදලේ හා රජයේ දායකත්වය	-	90,000,000.00	-
2020 වර්ෂයේ අරමුදලේ ශුද්ධ අතිරික්තය	40,673,250.47	8,247,392.00	48,920,642.47
පුනරුද අරමුදල	51,535,085.95	-	51,535,085.95
2020.12.31 දිනට බුද්ධ ශාසන අරමුදලේ ශේෂය	**761,498,417.67**	**98,247,392.00**	**769,745,809.67**

3.2 වෙන්කරන ලද ප්‍රතිපාදන(පවතීනම්) උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

අනු අංකය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරණු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණය රු. ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
	වාර්ෂික අයවැය මගින් බුද්ධශාසන අරමුදල සඳහා ප්‍රතිපාදන වෙන් වී නොමැත.			

3.3 පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්ය සාධනය

අනු අංකය	පරිත්‍යාග කළ ආයතනය	පරිත්‍යාගයේ අරමුණ	පරිත්‍යාග මුදල
1.	84 වැනි පාලකමණ්ඩල පරිශ්‍රම මහින්ද රාජපක්ෂ මහතා	බුද්ධශාසනයේ චිරපැවැත්ම උදෙසා බුද්ධශාසන අරමුදල මගින් ක්‍රියාත්මක වන වැඩසටහන් සඳහා	5,000.00
2.	84 වැනි පාලක මණ්ඩලපරිශ්‍රම පරිත්‍යාග සජිත් ප්‍රේමදාස මහතා	බුද්ධශාසනයේ චිරපැවැත්ම උදෙසා බුද්ධශාසන අරමුදල මගින් ක්‍රියාත්මක වන වැඩසටහන් සඳහා	3,500.00
3.	84 වැනි පාලක මණ්ඩලපරිශ්‍රම පරිත්‍යාග ගාමිණී සෙනරත් මහතා	බුද්ධශාසනයේ චිරපැවැත්ම උදෙසා බුද්ධශාසන අරමුදල මගින් ක්‍රියාත්මක වන වැඩසටහන් සඳහා	3,500.00
4.	84 වැනි පාලක මණ්ඩලපරිශ්‍රම පරිත්‍යාග කපිල ගුණවර්ධන මහතා	බුද්ධශාසනයේ චිරපැවැත්ම උදෙසා බුද්ධශාසන අරමුදල මගින් ක්‍රියාත්මක වන වැඩසටහන් සඳහා	3,500.00
5.	84 වැනි පාලක මණ්ඩලපරිශ්‍රම පරිත්‍යාග උදය කුමාර මහතා	බුද්ධශාසනයේ චිරපැවැත්ම උදෙසා බුද්ධශාසන අරමුදල මගින් ක්‍රියාත්මක වන වැඩසටහන් සඳහා	3,500.00
	මුළු ගණන		19,000/=

3.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

අනු අංකය	වත්කම් කේතය	කේත ස්ථරය	2020/12/31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය	2020/12/31 දිනට මූල්‍ය දත්ත වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම් කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
1.	9151	ගොඩනැගිලි ව්‍යුහයන්	-	3,500,000.00		100%

2.	9152	යන්ත්‍රෝපකරණ	-	-	-	-
3.	9153	ඉඩම්	-	7,000,000.00		100%
4.	9154	සේප්පුව	57,456.00	57,456.00		100%
	අවශේෂවත්කම්	ලී බඩු හා කාර්යාල උපකරණ	57,750.00	57,750.00		100%
		උපකරණ හා සවිකිරීම්	162,940.00	162,940.00		100%
		ශබ්ද විකාශන යන්ත්‍රය	45,885.00	45,885.00		100%
5.	9155	විද්‍යාත්මක වත්කම්	-			
6.	9160	කෙරීගෙන යන වැඩ	-			
7.	9180	බදු දෙන ලද වත්කම්	-			

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CAA/C/BSF/2020/FA

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2023 අගෝස්තු 16 දින

ලේකම්
බුද්ධශාසන අරමුදල

බුද්ධශාසන අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.එම්.යූ.එස්.ඒ. විජේකෝන්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් - 1. ලේකම් - බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සීඑෆ්/සී/බීඑස්එෆ්/2020/එෆ්ඒ   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2023 අගෝස්තු 16 දින

ලේකම්
බුද්ධශාසන අරමුදල

බුද්ධශාසන අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කල මතය

බුද්ධශාසන අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, අරමුදල් වෙනස්වීමේ සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල පනතේ 12(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව, 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් පහත සඳහන් එක් එක් අයිතමයන්ට අදාල තොරතුරු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

විෂයය	වටිනාකම රු.	ඉදිරිපත් නොකළ සාක්ෂි
බෞද්ධ ධර්ම ග්‍රන්ථ	6,578,146	සමීක්ෂණ මණ්ඩල වාර්තා
සුනාමි ආධාර	1,348,796	විස්තරාත්මක තොරතුරු
අත්තිකාරම් හා වෙනත් ලැබිය යුතු මුදල්	13,031,828	ශේෂ සනාථ කිරීම් හා වයස් විශ්ලේෂණය
ජංගම වගකීම්	1,712,435	ශේෂ සනාථ කිරීම් හා වයස් විශ්ලේෂණය

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි 264 අනුව සෑම ගෙවීමක්ම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබා ගත්, (අවශ්‍ය විට නිසි පරිදි මුද්දර යෙදූ) කුවිතාන්සියකින් තහවුරු විය යුතු වුවත් නියැදි පරීක්ෂාවේදි රු.1,903,671 කට අදාල ගෙවීම් සම්බන්ධයෙන් ලදුපත් ඉදිරිපත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද, ඇතැම් ගෙවීම් වවුචර් සමඟ වෙනත් ගෙවීම්වලට අදාල රිසිට්පත්/ලදුපත් පරීක්ෂා කිරීමකින් තොරව අමුණා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 (ආ) ඡේදයේ දැක්වෙන නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදලට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තිය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 (ආ) සහ 2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 03 ඡේදය	අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුව තිබුණද සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i)	මුදල් රෙගුලාසි 396	2013 සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළදී අරමුදල විසින් නිකුත් කරන ලද එකතුව රු.154,363 ක් වූ චෙක්පත් 09 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.
(ii)	මුදල් රෙගුලාසි 757	ගිණුම් වර්ෂය අවසානයේ භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(iii)	මුදල් රෙගුලාසි 877 (1) (ඇ)	ඉදිරි වර්ෂයේ අයවැය ලේඛනය භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම සඳහා පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් 2020 මුදල් වර්ෂයට අදාළ අයවැය ලේඛනය, පාලක මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම 2020 සැප්තැම්බර් 07 දින සිදු කර තිබූ බව නිරීක්ෂණය විය. තවද, 2020 මුදල් වර්ෂයට අදාළ අයවැය ලේඛනය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.
(iv)	මුදල් රෙගුලාසි 877 (2) (ඈ)	ගිණුම් වර්ෂය අවසන් වී මාස 2ක් ඇතුළත අරමුදල පිළිබඳ සහතික කළ මූල්‍ය ප්‍රකාශන ද සමඟ කාර්යසාධන වාර්තාව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත යොමු කළයුතු වුවත් 2020 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සහ කාර්යසාධන වාර්තාව වසර දෙකක ප්‍රමාදයකින් පසු 2023 ජුනි 20 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි.
(v)	මුදල් රෙගුලාසි 877 (2) (ඉ)	අරමුදලේ මූල්‍ය වාර්තා, කාර්යසාධන වාර්තා සහ විගණනය කර ලබා දෙන විගණන වාර්තා ඇතුළත් කරමින් වාර්ෂික කාර්යසාධන වාර්තාව නියමිත විධිවිධාන යටතේ භාෂාත්‍රයෙන්ම සකස් කර පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ගත වීමට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් 2018 සහ 2019 වර්ෂවලට අදාල වාර්ෂික කාර්යසාධන වාර්තා මෙම වාර්තාවේ දිනය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ල) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ළු) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) අරමුදලෙන් දීමනා, ආධාර වැනි ගෙවීම් කිරීමේදී බොහෝ අවස්ථාවල අදාල කාලසීමාව ඉකුත්වී මාස කිහිපයකට පසු ගෙවීම් සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය. ඒ අනුව, එකතුව රු.4,160,656 කට අදාලව මාස 04 සිට මාස 24 දක්වා ප්‍රමාදයන් සිදුවූ අවස්ථා 18 ක් විය.

(ආ) 2020 වර්ෂයට අදාළව අනුමත කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අදාළව ප්‍රගති වාර්තාවක් පිළියෙල කර නොතිබුණු බැවින් අරමුදලෙන් අපේක්ෂිත අරමුණු ඉටු කර තිබේද යන්න විගණනයේදී පරීක්ෂා කළ නොහැකි විය.

2.3 **වෙනත් විගණන නිරීක්ෂණ**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබූ රු.13,031,828 ක් වූ ලැබිය යුතු අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතු මුදල් ශේෂයෙන් රු.1,087,447 ක් වර්ෂ 08 කට සහ රු.11,944,381 ක් වර්ෂ 05 කට වඩා පැරණි ශේෂයන් (පසුගිය වර්ෂවල මූල්‍ය ප්‍රකාශන අනුව) වූ අතර මෙම වාර්තාවේ දිනය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබූ රු.1,712,435 ක් වූ ජංගම වගකීම් ශේෂයෙන් රු.544,409 ක් වසර 06 කට සහ රු.1,168,025 ක් වසර 05 කට වඩා පැරණි ශේෂ වූ අතර එම ශේෂ නිරවුල් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) අරමුදල සම්බන්ධයෙන් පහත සඳහන් මාතෘකාවලට අදාල තොරතුරු කිසිවක් කාර්යසාධන වාර්තාවෙහි අන්තර්ගතව නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශය
(ii) වෙන්කරන ලද ප්‍රතිපාදන (පවතී නම්) උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය
(iii) පරිත්‍යාග සහ වෙනත් ලැබීම් පිළිබඳ කාර්යසාධනය
(iv) මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය
(v) බුද්ධශාසන අරමුදලේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

04. පරිච්ඡේදය කාර්ය සාධන දර්ශක

4.1 බුද්ධශාසන අරමුදලේ කාර්ය සාධන දර්ශක

බුද්ධශාසන අරමුදල
වාර්ෂික කාර්ය සාධනය - 2020 වර්ෂය

විස්තරය	ඇස්තමේන්තු වටිනාකම රු.	සත්‍ය ආදායම/ වියදම රු.	දර්ශකය %
ආදායම			
පොලී ආදායම	55,000,000	53,739,361	97.71
පොත් අලෙවි ආදායම	1,200,000	612,149	51.01
පරිත්‍යාග හා වෙනත් ලැබීම්	300,000	19,000	6.33
	56,500,000	**54,370,510**	**96.23**
ව්‍යාපෘති වියදම්			
සාමණේර ආයතන පවත්වාගෙන යාම සඳහා මූල්‍යාධාර ලබා දීමේ වැඩසටහන හා සාමණේර ආයතන පරීක්ෂා කිරීම.	2,400,000	942,628	39.28
සාමණේර ආයතන විභාගය හා සාමණේර ආයතන අධීක්ෂණ මණ්ඩල රැස්වීම් පැවැත්වීම.	650,000	12,000	1.85
භික්ෂූන් වහන්සේලා සහ දසසිල් මාතාවන් වහන්සේලා සඳහා වෛද්‍යාධාර ලබා දීම.	3,000,000	2,310,000	77.00
සාමණේර ස්වාමීන් වහන්සේලා සහ ශිෂ්‍ය දසසිල් මෑණියන් වහන්සේලා සඳහා ශිෂ්‍යාධාර කැපකරු යෝජනා ක්‍රමය	13,800,000	8,186,973	59.33
භාෂා හා සංස්කෘතික අධ්‍යයන ආයතන පිහිටුවීම.	1,533,000	94,500	6.16
වයස්ගතව පැවිදි වූ භික්ෂූන් වහන්සේලාට පැවිදි ජීවිතය සම්බන්ධව ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම.	1,215,000	112,570	9.27
දිවයින පුරා පිහිටි දුක්ෂර විහාරස්ථාන සඳහා සනීපාරක්ෂක පහසුකම් වෙනුවෙන් ආධාර ලබා දීමේ ව්‍යාපෘතිය	5,000,000	1,200,000	24.00
පාලන වියදම්			
විගණන ගාස්තු	100,000	-	-
පරිපාලන වියදම්	1,000,000	718,975	71.90
මුළු වටිනාකම (ක්ෂය වටිනාකම හැර)	**28,698,000**	**13,577,646**	**47.31**
ක්ෂය වටිනාකම	-	119,614	
මුළු වියදම	**28,698,000**	**13,697,260**	
අතිරික්තය	**27,802,000**	**40,673,250**	

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනාගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

අනු අංකය	අරමුණු	ඉලක්කය	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
				0 – 49%	50% - 74%	75% - 100%
1.	භික්ෂු නිරෝගීතාවය	1. වෛද්‍යාධාරදීම් (මාසිකව) 2. රෝහල් ගාස්තු ප්‍රතිපූර්ණය 3. වයෝවෘද්ධ භික්ෂූන් රැකබලා ගැනීම්	භික්ෂු නිරෝගීතාවය ඇති වීමේ ප්‍රමාණය	√		
2.	භික්ෂු අධ්‍යාපනය	1. ශිෂ්‍යාධාර 2. පුහුණු වැඩසටහන් 3. වර්ෂාවසාන පරීක්ෂණ 4. අධ්‍යාපන ආයතන පවත්වාගෙන යාම	භික්ෂු අධ්‍යාපනය නංවාලීම.		√	
3.	විහාරස්ථාන පහසුකම්	විහාර ආධාර	විහාරස්ථාන පහසුකම් වැඩි දියුණු කිරීම			√

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසාර සංවර්ධන ඉලක්ක අතරින් "**තිරසාර සංවර්ධනය පිණිස සාමකාමී හා සංයුක්ත සමාජ ප්‍රවර්ධනය උදෙසා සැමට ප්‍රවේශය ලබා දීම සහ ඵලදායි වගවීමසහිත සංයුක්ත ආයතන ගොඩනැගීමහා 16 වන සංවර්ධන ඉලක්කය සපුරා ගැනීමට මෙම අමාත්‍යාංශය මගින් සෘජු දායකත්වයක් ලබා දීම සිදුවේ.ආයතන ගොඩනැගීම** "යන 16 වන සංවර්ධන ඉලක්කය සපුරා ගැනීමට බුද්ධශාසන අරමුදල මගින් සෘජු දායකත්වයක් ලබා දීම සිදු වේ.

ඒ අනුව යමින්, බුදු දහමේ උන්නතිය උදෙසා ක්‍රියාත්මක බුද්ධශාසන අරමුදල ශක්තිමත් කරමින් බුද්ධශාසනයේ චිර පැවැත්ම අත්‍යවශ්‍ය වන මහසඟරුවනේ උන්නතිය උදෙසා නොයෙකුත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදුවේ. නමුත් භික්ෂූන් වහන්සේලා උපැවිදි වීම බහුල වීම හා ශාසනයට ඇතුළු වන පිරිස් අවම වීම ප්‍රධාන බාධාවක් වන බැවින් සිටින ස්වාමීන්වහන්සේලා ප්‍රමාණය රැක බලා ගනිමින් උපරිම ශාසනික සේවාවන් ලබාගෙන බුදු සසුනේ උන්නතිය උදෙසා කටයුතු කිරීමට මෙම අරමුදල මගින් උපරිම දායකත්වයක් ලබා දීම සිදුවේ.

2020 වර්ෂය තුළ කෝවිඩ් වසංගත රෝග තත්වය හමුවේ වුවද නියමිත ඉලක්ක සපුරා ගැනීමට හැකිවීම අරමුදල ලද ජයග්‍රහණයක් වේ.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

අනු අංකය	සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ අතිරික්ත
1.	ජ්‍යෙෂ්ඨ	02	02	-
2.	තෘතියික	-	-	-
3.	ද්විතියික	05	05	-
4.	ප්‍රාථමික	01	01 (තාවකාලික)	

6.2 කාර්ය සාධනයඋදෙසා මානව සම්පත් හිගය හෝ අතිරික්තයේ බලපෑම

1990 අංක 35 දරණ බුද්ධශාසන අරමුදල් පනතේ 7 (ඊ) හා 14 වැනි වගන්ති යටතේ පාලක මණ්ඩලය විසින් පනවනු ලබන නීතිවල සඳහන් පරිදි අරමුදලේ ප්‍රධාන විධායකයා ලෙස 02 (II) පාලක මණ්ඩලය විසින් පත් කරනු ලබන ලේකම් වරයෙකු සිටිය යුතුය. එම ලේකම්වරයා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාද වන අතර හැකි සෑම විටම බුද්ධශාසන අමාත්‍යාංශයට අනුයුක්ත රජයේ මාණ්ඩලික නිලධාරියෙකු අතරින් ලේකම් නම් කරගත යුතු බව දක්වා ඇත.

මේ අනුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු තම නිත්‍ය රාජකාරියට අමතරව මෙම ලේකම් තනතුරේ වැඩ බැලීම සිදු කරනු ලැබේ. අරමුදලට යෝජිත ඉතිරි තනතුරුද මෙතෙක් කලමනාකරණ සේවා දෙපාර්තමෙන්තුව වෙතින් විධිමත්ව අනුමත කර ගෙන නොමැත. ඒ අනුව යෝජිත තනතුරු බොහොමයක් පොදුවේ කිසිදු අමතර දීමනාවකින් තොරව අමාත්‍යාංශ කාර්යය මණ්ඩලය මගින් රාජකාරි ඉටු කර දීම සිදු කරනු ලබයි.

6.3 මානව සම්පත් සංවර්ධනය

ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන නොමැති බැවින් පුහුණු වැඩ සටහන් වෙන්කොට ක්‍රියාත්මක කර නොමැති අතර අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල සහයෙන් අරමුදලේ කටයුතු ඉටුවන බැවින් අමාත්‍යාංශ කාර්ය මණ්ඩල පුහුණු යටතේම එම නිලධාරීන්ද පුහුණුව ලබා ඇත.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සදහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	√		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	ව්‍යාපාර හා නිෂ්පාදන කාර්යයන් ඉටු නොකරන බැවින්	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	ගබඩා අත්තිකාරම් ගිණුම් කටයුතු නොපවතින බැවින්	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	විශේෂ අත්තිකාරම් ගිණුම් නොපවතින බැවින්	
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛණ නඩත්තු කිරීම**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අදාළ නොවේ		

2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.10	බැරකම් ලේඛනයයාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	√		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	√		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	√		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	√		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරය න්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අදාළ නොවේ		
4			**වාර්ෂික සැලසුම් සකස් කිරීම**	
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	√		

4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	√		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	√		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	√		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	√		
5		**විගණන විමසුම්**		
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	√		
6		**අභ්‍යන්තර විගණනය**		
6.1	මු.රෙ 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	√		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා දී තිබීම	√		

6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේනතුවට ඉදිරිපත්කර තිබීම	√		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත්කර සිටීම	√		
7		විගණන හා කළමනාකරණ කමිටු		
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	√		
8		වත්කම් කළමනාකරණය		
8.1	අංක 1-2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	√		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට	√		

	වාර්තා කිරීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	√		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	√		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	√		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අදාළ නොවේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අදාළ නොවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාළ නොවේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අදාළ නොවේ		
9.5	2016.06.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1	අදාළ නොවේ		

	ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම			
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අදාළ නොවේ		
10	**බැංකුගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත්කර තිබීම	√		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශෙෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	√		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	√		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි	√		

	බැරකම්වලට එළඹීම			
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අදාළ නොවේ		
12.2	හිඟ හිටි ණය ශේෂ පිලිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අදාළ නොවේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අදාළ නොවේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාළ නොවේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අදාළ නොවේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	√		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	√		
14.4	අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අදාළ නොවේ		
15	**ආදායම් ගිණුම්**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ	අදාළ නොවේ	ආදායම් ගිණුම් නොපවතින බැවින්	

	ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම			
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කොට තිබීම	අදාළ නොවේ	අදාළ නොවේ	
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	අදාළ නොවේ	අදාළ නොවේ	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	√		
16.2	කාර්යමණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	√		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම	√		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාළ නොවේ		
17.2	ආයතනය පිලිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට	අදාළ නොවේ		

	පහසුකම් සලසා තිබීම			
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2018 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	√		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි , පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	√		
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	√		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අඩුම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	√		

19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	√		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	√		
20		විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම		
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම.	√		